# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2173/4 - 2020 අප්‍රේල් මස 27 වැනි සඳුදා - 2020.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබා දීම පිණිස ජනාධිපති කාර්ය සාධක බලකායක් පත්කිරීම.

1. මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝර්ස් රොෂාන් ගුණතිලක මැතිතුමා
2. අද්මිරාල් ජයන්ත පෙරේරා (විශ්‍රාමික) මැතිතුමා
3. රියර්අද්මිරාල් ආනන්ද පීරිස් (විශ්‍රාමික) මැතිතුමා
4. මේජර් ජනරාල් සුමේධ පෙරේරා (විශ්‍රාමික) මැතිතුමා
5. වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන මැතිතුමා
6. වෛද්‍ය වජිර සේනාරත්න මැතිතුමා

වෙත,

ශුභාශිංසන පෙරටුවයි !

කොවිඩ් - 19 ලෝක වසංගතයක් බවට පත්වීම හා සමගාමීව ශ්‍රී ලංකාවේ ජනතාව මෙන්ම ත්‍රිවිධ හමුදාවේ පුද්ගලයන් ද එම රෝගය ආසාදනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරනු ලබන බැවින් ද,

මෙය වළක්වා ගැනීම සඳහා ඉතා කඩිනම් හා ක්ෂණික ක්‍රියා මාර්ග ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව මවිසින් හඳුනාගෙන ඇති බැවින් ද,

1A - G 032225 — 32 (2020/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝර්ස් රොෂාන් ගුණතිලක මැතිතුමා
2. අද්මිරාල් ජයන්ත පෙරේරා (විශ්‍රාමික) මැතිතුමා
3. රියර්අද්මිරාල් ආනන්ද පීරිස් (විශ්‍රාමික) මැතිතුමා
4. මේජර් ජනරාල් සුමේධ පෙරේරා (විශ්‍රාමික) මැතිතුමා
5. වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන මැතිතුමා
6. වෛද්‍ය වජිර සේනාරත්න මැතිතුමා

උක්ත ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් පහත කාර්යයන් ඉටු කිරීම සඳහා පත් කරමි.

1. ත්‍රිවිධ හමුදාව කොවිඩ් - 19 පැතිර යාම පාලනය කිරීම සඳහා සෘජුව සම්බන්ධවී ඇති නිසා, ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට කොරෝනා වෛරසය ආසාදනය වැළඳීමේ අවස්ථාවන් වළක්වා ගැනීම සඳහා සෑම කඳවුරක්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එම පියවර ගැනීම සඳහා උපදෙස් ලබා දීම ;

2. එම උපදෙස් නිසි ලෙස ක්‍රියාත්මකවේදැයි පරීක්ෂා කිරීම ;

3. වැලිසර නාවික හමුදා කඳවුර වැනි විශාල ප්‍රමාණයක් හමුදා සාමාජිකයින් ආසාදනය වුණු කඳවුරුවල රෝගය පැතිර යාම පාලනය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග නිසියාකාරව ගන්නවා ද යන්න නිර්ණය කිරීම ;

4. කොරෝනා වෛරසය ආසාදනය වුණු ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ පවුල්වල සාමාජිකයින් සාමාන්‍ය ප්‍රතිපත්ති අනුව නිරෝධායන කඳවුරුවලට යොමු කර තිබේ ද යන්න පරීක්ෂා කර බැලීම ;

5. ත්‍රිවිධ හමුදා සාමාජිකයින් හරහා මෙම රෝගය සමාජගත වීම වැළැක්වීම සඳහා උපරිම ඵලදායී ක්‍රමවේදයක් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම ;

6. ඉදිරියේ දී හමුදා සාමාජිකයින් නිවාඩු යෑමේදී රෝගය පැතිරීම හා වැළඳීම වැළැක්වීමට ගත යුතු ක්‍රියා මාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම ;

7. මෙම රෝගය වැළැක්වීම සඳහා හා නිරෝධායන කටයුතුවලදී හමුදා සාමාජිකයින් ක්‍රියාන්විතවල යොදවන විට ගත යුතු සෞඛ්‍ය ආරක්ෂක පියවර හඳුන්වාදීම සහ එය ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම ;

8. පොදුවේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සෑම කඳවුරක්ම ගත යුතු පියවර නිර්ණය කිරීම සහ ඒවා ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

තව ද, මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝර්ස් රොෂාන් ගුණතිලක මැතිතුමා උක්ත කාර්ය සාධක බලකායේ සභාපති ලෙසත්, ජනාධිපති අතිරේක ලේකම්, ටී.ටී. උපුල්මලී මැතිතුමිය කාර්ය සාධක බලකායේ ලේකම් ලෙසත්, පත් කරමි.

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබා දීම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබා දීම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබට කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තව ද, ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබා දීම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම ත්‍රිවිධ හමුදා සාමාජිකයින් හා රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයි ද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියලුම ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට හා රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තව ද, කිසියම් ත්‍රිවිධ හමුදා සාමාජිකයෙකු හෝ රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙරකී කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීම ප්‍රමාද කරන හෝ පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ අප්‍රේල් මස 27 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.